# අමා ගඟුල

කලාප අංක : 74

ශ්‍රී. බු. ව. 2557 ක්වූ ඉල් මස කලාපය, ක්‍රි. ව. 2013 ක් වූ නොවැම්බර් මස 17 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතා ගරු යාවජීව සභාපති
ඊ. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

## මී පිඬුවක මිහිරියාව ඇති කෙලෙස් නසන ඔසුව

(මජ්ඣිම නිකාය - මධුපිණ්ඩික සූත්‍රය

ධර්මකාමී පින්වතුනි,

අද ශ්‍රී බුද්ධ පරිනිර්වාණ වර්ෂ ක්‍රමයෙන් 2557 ක් වූ ඉල් මස පුර පෝ දිනයයි. ක්‍රිතු වසින් 2013 ක් වූ නොවැම්බර් මස 17 දිනට යෙදුණු පුර පොහෝ දිනයයි. ශාසන ඉතිහාසයේ ඉතා වැදගත් කරුණු කිහිපයක් සිහිපත් කරන දිනයකි. ඒ අතර විශේෂයෙන් ශාන්ති නායකයාණන් වහන්සේ පළමු වස් කාලය ගත කිරීමෙන් පසු ප්‍රථම ධර්මදූත පිරිස ධර්ම ප්‍රචාරය සඳහා පිටත් කර තමන් වහන්සේද තුන් බෑ ජටිලයන් දමනය කිරීම සඳහා උරුවෙල් දනව්වට වැඩම කිරීම. සැරියුත් මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑම මෙම වසරේ චීවර මාසයේ කඨින චීවර පූජාව කළ හැකි අන්තිම දිනය වීම ද ඒ අතර වනු ඇත.

අද දහම් පණිවුඩය සඳහා මාතෘකා කර ගත්තේ මැදුම් සඟියෙහි මහාසීහනාද වග්ගයෙහි මධු පිණ්ඩික සූත්‍රයයි. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය දේශනා කරන ලද්දේ ශාක්‍ය ජනපදයේ කපිල වස්තු නුවර හෙවත් කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයේදිය. උන්වහන්සේ මෙදින පෙරවරු කාලයේ හැඳ පෙරවා පිඬුසිඟා වළඳා දිවා විහරණය සඳහා අසල ඇති මහා වනයට වැඩම කර මනා අතුපතර වැඩුණු තරුණ බෙලි ගසක සෙවනෙහි විවේක සුවයෙන් වැඩසිටියහ.

ඒ අතර එතැනින් සක්මන් කරමින් සිටි දණ්ඩපාණි නම් ශාක්‍යයෙක් විය. මොහු භාග්‍යවතුන් වහන්සේගේ ඥාති පරපුරේ කෙනෙකි. ඔහු නිතරම දණ්ඩක් (ටිටක්) අතැතිව ගමන් කිරීම සිරිතකි. භාග්‍යවතුන් වහන්සේ අසල එකත්පසෙකට වී ටිටෙහි එල්ලීලා මෙන් පැද්දෙමින් ශාක්‍යයන්ගේ ස්වභාවයක් වූ මාන්නයද හිතේ ඇතිව ගෞරව කිරීම් කිසිත් නැතිව භාග්‍යවතුන් වහන්සේ අමතා **"කිංවාදී සමණො කිමක්ඛායී"** හි? ("ශ්‍රමණ භවත් ගෞතමයෝ මොනවගේ දහමක් කියන්නේද? කුමක් ප්‍රකාශ කරනවද?") යනුවෙන් ඇසීය.

භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු දෙනව, "ආයුෂ්මතුනි දිව්‍ය, බ්‍රහ්ම, මාරයින් සහිත මුළු ලෝක ප්‍රජාව අතර යමෙක් කිසිවකු හා වාද විවාද නොකරයිද, කාමයන් සමග වාස නොකොට ශ්‍රේෂ්ඨත්වයට පත්ව සැක සංකා නැති කොට තන්හා දුරු කොට හඳුනාගන්නා (සංඥා) අරමුණු නිසා කෙලෙස් ඇති වීමට ඉඩ නොදෙන්නෙක් වේද? මම එවැනි ස්වභාවයෙන් යුතු කෙනෙකි. මගේ ප්‍රකාශය එයයි." යනුවෙන් වදාළහ. හිතේ මානය ඇති දණ්ඩපාණිට මේ ගැන එතරම් වැටහීමක් නොවීය. නමුත් මානය නිසා ඒ බව නොපෙන්වා හිස වනා දිව නළවා "එහෙමද?" කියලා ආපු විදියටම ටිටද අනිමින් ගියේය.

එදින සවස දම්සභා මණ්ඩපයේදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේ අමතා දහවල් කාලයේදී දණ්ඩපාණිට තමන් වහන්සේ කිනම් ආකාරයේ කෙනෙකුදැයි ඔහුට කියාදුන් ආකාරයටම මෙහිදීද දේශනා කළහ. එවිට එක්තරා භික්ෂු නමක් "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔහුට දුන් පිළිතුර පරිදි කොහොමද මේ හඳුනාගන්නා අරමුණු වලින් (සංඥාවන් නිසා) කෙලෙස්

ඇති නොවන ලෙසට හැසිරෙන්නෙ." යනුවෙන් විමසුවා. ඒ සඳහා භාග්‍යවතුන් වහන්සේ සත්වයන්ගේ සිත තුළ කෙළෙස් ක්‍රියාත්මක වන විධි පිළිබඳව ඉතා චමත්කාර ධර්ම රසය වෑහෙන කරුණු 07ක් සහිත විග්‍රහයක යෙදුණා. මහණෙනි සත්වයා බොහෝ කල් සසරෙහි ගමන් කරවන තෘෂ්ණා දෘෂ්ඨි සංඛ්‍යාත යම් යම් හඳුනා ගැනීම් (සංඥා) කොට්ඨාසයෝ සත්වයා සහගතව පවතිද ඒ නිසා (මමය මාගේ යයි) සතුටු විය යුත්තෙක්, බැසගත යුත්තෙක්, කිව යුත්තෙක් නැත්නම් එයම 01. රාගානුසයන්ගේ (ඇලීමේ ගතියෙහි) කෙළවරය. 02. පටිඝානුසයන්ගේ (කේන්තියෑමේ, තරහ යෑමේ, ගැටීමේ ස්වභාවයෙහි) කෙළවරය. 03. දිට්ඨානුසයන්ගේ (මමය මාගේය යනුවෙන් ආත්මවාදීව අල්ලා ගැනීමේ ) කෙළවරය. 04. විචිකිච්ඡානුසයන්ගේ (බුද්ධාදී අටතැන් පිළිබඳ සැකයෙහි) කෙළවරය. 05. මානානුසයන්ගේ (තමා හා අනුන් උස් පහත් කොට මැනීමේ ස්වභාවයෙහි) කෙළවරය. 06. භවරාගානුසයන්ගේ (සසර පැවත්මට ඇති කැමැත්තෙහි) කෙළවරය. 07. අවිජ්ජානුසයන්ගේ (ආර්‍ය සත්‍ය නොදන්නාකමෙහි) කෙළවරය යනුවෙන් සත්ව සන්තානයේ සියුම්ව හෝ භවයෙන් භවයට යන අනුසය ධර්ම හෙවත් කෙළෙස් මළ හතක් පැහැදිලි කොට මහණෙනි, මෙයම සත්වයා දඬු මුගුරු, ආයුධ ගැනීම, කලහ, විග්‍රහ, විරුද්ධ වීම, බැත ගැනීම, කේලාම්, බොරු කීම ආදියට හේතු වන චේතනාවන්ගේ කෙළවර වෙයි. මේ ළාමක අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් නිරුද්ධ වෙතියිද වැඩිදුරටත් වදාරා භාග්‍යවතුන් වහන්සේ ආසනයෙන් නැගිට විහාරයට වැඩි සේක.

එතැන වැඩ සිටි භික්ෂූන් වහන්සේලාට භාග්‍යවතුන් වහන්සේ කෙටියෙන් වදාළ මේ දහම විස්තර අරුත් වශයෙන් දැනගැනීමට ඕනෑවි, කච්චායන මහරහතන් වහන්සේ ළඟට ගියා. භාග්‍යවතුන් වහන්සේ වදාළ ඒ දහම ඒ විදියටම කිව්වා මේ තරම් හොඳින් දේශනා කොට දීලා තිබියදී තමන් වහන්සේ පැහැදිලි කළද මේ ටිකම තමයි කියලා. උන්වහන්සේ ශාස්තෘ ගෞරවයෙන් යුතුව මැලි බවක් දක්වා නැවත නැවත ඇවිටිලි කරන නිසා කෙටියෙන් වදාළ ධර්මය විස්තර කොට ප්‍රකාශ කරන භික්ෂූන් අතරින් අගතැන් පත්වූ කච්චායන හාමුදුරුවො මේ දේශනාවද විස්තර වශයෙන් පැහැදිලි කළේය.

ඇවැත්නි, ඇසද. රූපයන්ද නිසා ඇස නිසා හටගන්න රූප දැනගන්නා වූ සිත හෙවත් චක්ඛු විඥ්ඥාණය උපදී. ඒ තුනෙහි එකතුව ස්පර්ශය හෙවත් ගැටීමක් වේ. මේ සම්බන්ධයෙන් රූපය බලනවා කියන හැඟීම එනවා. එය වේදනාවයි. එහෙම නැතිනම් එය විඳීමයි, දැනීමයි. එසේ දකිනවා යන හැඟීමත් එක්කම අහවල් රූපය යයි හඳුනා ගන්නවා. හිතට ගන්නවා අහවල් රූපයක් දැක්කා කියලා. ඒ ගත් හිත (සංඥාව) අනුව විවිධාකාරයෙන් කල්පනා කරනවා යනුවෙන් වදාරා කණ, නාසය, දිව, ශරීරය මනස යන ආයතන හයටම ඉහත කී ධර්ම න්‍යාය ඒ විදියටම බලපාන ආකාරය විස්තර කරලා ඇස නැතිනම් රූපය නැති කල්හි චක්ඛු විඥ්ඥාණය නැතිනම් ස්පර්ශයක් හට නොගනී. ස්පර්ශය නැති කල්හි වේදනාවක් නොවේ. වේදනා නැති කල්හි සංඥා නොවේ. සංඥා නැති කල්හි කල්පනා හෙවත් සිතිවිලි නොවේ. සිතිවිලි නැති කල්හි බොහෝ කාලයක් තණ්හා දිට්ඨි මාන වශයෙන් පැවැත්මක් ඇති නොවන්නේය යනුවෙන් කච්චායන හාමුදුරුවෝ භාග්‍යවතුන් වහන්සේ කෙටියෙන් වදාල දහමෙහි අර්ථය මෙසේ දනිමියි වදාරා ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් මේ අර්ථය අසා යම් විදියකින් උන්වහන්සේ වදාරන සේක්නම් ඒ ලෙසින්ම දරාගන්න යයි දේශනා කළා. භාග්‍යවතුන් වහන්සේට මේ සියළු විස්තර ස්වාමීන් වහන්සේලා පැවසුව. භාග්‍යවතුන් වහන්සේ සාදු නාදයක් පවත්වල "මම විස්තර සහිතව දේශනා කළත් ඕය සූත්‍රය ඔහොමමයි. මහා කච්චායන බොහෝම හොඳයි" කියලා අනුමත කළා.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කරද්දී ආනන්ද හාමුදුරුවො මෙය අසා ස්වාමීනි! මී වදයකින් කෑල්ලක් අරගෙන මොන පැත්ත දිවගාලා බැලුවත් එකම මී පැණි රසය දැනෙනවා වගේ මේ සූත්‍රයේ මුල සිට අගටත් අගසිට මුලටත් අසන විට පුදුම මිහිරියාවක් දැනෙනවා යයි පවසා ස්වාමීනි! මේ සූත්‍රය කිනම් නමකින් හඳුන්වනවාදැයි විමසීය. ආනන්ද ! එසේ නම් මේ සූත්‍රය මී පිඬුවක් සේ දැනේනම් මධු පිණ්ඩික සූත්‍රය යනුවෙන් නම් කරමියි වදාළ සේක.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දණ්ඩපාණි හට ඔහුගේ විමසීමට දුන් පිළිතුර දම්සභා

මණ්ඩපයේදී භික්ෂූන් වහන්සේට පැහැදිලි කිරීමෙන් මතුවූයේ හඳුනාගන්නා අරමුණු වලින් කෙළෙස් ඇති නොවන විදියට කොහොමද හැසිරෙන්නේ යන්නයි. මේ සූත්‍රයෙන් ඉගෙන ගන්නට ඇති වඩාත්ම වැදගත් කාරණය ද එයයි.

අපේ හිතේ කෙළෙස් ක්‍රියාත්මක වන අවස්ථා 03ක් තියෙනවා. **1. අනුසය 2. පරියුට්ඨාන 3.වීතික්කම** යනුවෙනි. එයින් අනුසය යනු සත්වයින්ගේ සිත තුළ නැවත නැවත ඉපදෙන කෙළෙස් ස්වභාවයන් නිතරම සියුම් ලෙස තුනිවී නිද්‍රෝපගතව පැවතීමයි. මෙම කෙළෙස් සතක් මේ සූත්‍රයේම දැක්වෙනවා. එනම් අනුසය සතකි. ඒ සත පිළිබඳව සියුම් දැනුමක් කා හට වුවද තිබිය යුතුයි. **රාගානුසය** යනු ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියන්ට ගොදුරු වන අරමුණු වලට ඇති කැමැත්ත. එනම්, කාමයන්ට ඇලීමේ ගතියයි. කෙළෙස් සහිත සත්වයාගේ සිත තුළ මෙය තැන්පත් වී පවතිනවා. **පටිඝානුසය** යනු කේන්ති යන ස්වභාවයයි, තරහවයි. අපි නොදැනුවත්වම අපේ සිතේ ඉතාම තුනීයට තිබෙනවා. යම් යම් අරමුණු වලදී මේ සියුම්ව තැන්පත් වී ඇති පටිඝානුසය හෙවත් සියුම් තරහව ඇවිස්සී ද්වේෂයක් වී ගැටෙනවා. ඊළඟට **දිට්ඨානුසයයි.** මමය මාගේය යනුවෙන් ආත්ම දෘෂ්ඨියක් පවතිනවා. මෙය නිතරම අප සිත තුළ ක්‍රියාත්මක වෙනවා. මේ තත්වය නිසා තමයි සීමා වැටකඩුලු අයිතිවාසිකම් වලින් ආශා බහුල වෙන්නෙ. ආශාව වැඩිවන්න වැඩිවන්න කවදාහරි අයිතිවාසිකම් හදාගත්තු දේ ගිලිහෙන විට දුකත් ඒ තරමට වැඩිවෙනවා. මේ ලෝකෙට අපි එද්දිත් භෞතික වූ කිසිවක් රැගෙන ආවේ නැහැ. යන්නෙත් කවදා හෝ අත්හැරලයි. අඩු තරමින් දිවා රෑ නොබලා පෝෂණය කළ පිරිසිදු කළ ශරීරයත් දාලයි යන්නෙ.

ඊළඟට **විචිකිච්චානුසයයි.** මෙයත් අප සිත තුළ සියුම්ව භවයෙන් භවයට ගමන් කරනවා. ඒ නුවණින් දකින්නට, දැනගන්නට ශක්තිය නැතිකමයි. තෙරුවන් පිළිබඳ සැකය සත්වයාගේ අතීතය සහ අනාගත කාලයට අදාල සැකය. ඒ දෙකම පිළිබඳ සැකය. ශික්ෂා පිළිබඳ සැකය. හේතුඵල දහම පිළිබඳ සැකයයි. ඕනෑම සම්බන්ධයක් ඇති වීමට ප්‍රාථමික මට්ටමින් හෝ විමර්ශනාත්මක විශ්වාසයක් තිබිය යුතුය. එය ආර්ය විනයෙහි ශ්‍රද්ධාව නමින් හැඳින්වේ.

ඊළඟ කාරණය **මානානුසයයි.** එක එක මට්ටම් වලින් මැනීමයි. මෙය **සෙය්‍යමාන, සදිස මාන, හීනමාන** ලෙසින් තුනකි. හැමවිටම තමන් ඉහලින් තබා අනුන් පහත දැමීම සෙය්‍යමානයයි. අනිත් අයත් එක්ක සමවීමට යෑම සදිස මානයයි. හැමතිස්සෙම තමන් පහත්කොට සිතීම හීනමානයයි. මේ ස්වභාවය අප සිතේ සියුම්ව අනුසය ලෙසින්ම පවතිනව.

ඊළඟට **භවරාගානුසයයි.** රාගනම් ඇලීමයි කැමැත්තයි. පැවැත්මට ඇති කැමැත්ත භවරාගානුසයයි. අපි මෙලොව ඉන්නේ පැවැත්මට ඇති ආසාව නිසාය කවදාහරි ආයු කම් ගෙවීම නිසා මෙලොව අත්හරින්න සිදුවුනත් අත්හරින්නෙ තවතැනක පවතින කැමැත්ත ඇතිවයි. ඒ නිසයි තව තැනක උපදින්නෙ. ඊට කරුණු හැමවිටම අපි නොදැනුවත්වම සකස් කරනවා. ඒ මුළ බීජය අප සිත තුළ පවතිනවා එය භවරාගානුසයයි.

**අවිජ්ජානුසය** යනු අපේ සිත තුළ කිඳා බැහැල තියෙන අනවබෝධයයි. කුමක් පිළිබඳ අනවබෝධයද? සත්‍ය පිළිබඳයි. ආර්‍ය සත්‍ය නොදන්නා කමයි. කුසලය පිළිබඳව අනවබෝධයයි. බුදුවරු ලෝකෙ පහළ වන්නේ මෙය කියාදීමටයි. **"සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා"** පව් දුරු කරන්න. කුසල් වඩන්න. නමුත් අද සමාජයේ මේ අවවාදය වරද්දාගෙන බොහෝ සෙයින් කරන්නෙම පින්. පින් කරමින් කම් රැස් කරනවා. සසර ගමන යනව. පින් කරාම හොඳ විපාක ලැබෙනව. ඒක සත්‍යයකි. එනමුත් සසරට ආවේනික වූ එනම් ඉපදීමේදී, වයසට යනකොට, ලෙඩවෙනකොට, ප්‍රිය දේ නැති වෙනකොට, අප්‍රිය දේ එකතු වෙනකොට මරණයට පත්වෙනකොට ඒ දුක් කරදර වලින් මිදෙන්න එයින් බැහැ. බුදුහිමියන් පහළවීමට පෙරත් ආගම් ශාස්තෘවරු හොඳ දේ කරන්න කියලා අවවාද කළා. නමුත් ඒ ඇත්තන්ට කුසලය ගැන වැටහීමක් නැහැ. බුදුවරු පමණයි මේ වැටහීම ලබා දෙන්නෙ. එනම් නිවනයි. නිවන යනු තණ්හාව නැති කිරීමයි. ඒ සුවය පින් කරලා තණ්හාව ඇති කරගැනීම තුළින් ලබන්න බැහැ. නමුත් සත්වයා වර්තමානයෙ කවදත් මේ න්‍යාය තුළමයි දුවන්නෙ. ඒ අවිජ්ජානුසයේ බලවත් කමයි. බුද්ධ වචනය නොවීමසීමයි.

වර්තමන් බෞද්ධ සමාජයේ ප්‍රධාන දුර්වලකම වී ඇත්තේ මේ අවිජ්ජානුසයයි. 2013 ඔක්. 16 වන දින ලංකාවේ පුවත්පතක් වන "තරුණී" පත්‍රයේ 29 පිටුවේ පළවූ ලිපියක "පංච ශීලයේ පිහිටන්න. ප්‍රතිපත්ති ගරුක වන්න. ඔබටත් ශ්‍රී ස්කන්ධ දෙවි පිහිට තියනයි..." යනුවෙන් ලිපියක් පළවී තිබුනා. එහි වරදක් නොකියමි. එම ලිපියේ අවසානයේ මෙසේද දක්වා තිබුනා. "ශ්‍රී ස්කන්ධ දෙවියෝ පසුගිය දිනවල කැබිලිත්ත ප්‍රදේශයේ භාවනානුයෝගීව මාර්ගඵල ලැබීම සඳහා වැඩසිටියහ. එහෙත් මිනිසුන් ඉවක් බවක් නැතිව එම ප්‍රදේශයට යාම නිසා එය එතුමන්ට හිරිහැරයක් විය." යනුවෙනි. ස්කන්ධ දෙවියෝ පිනට වඩා කුසලය අගය කරන බව වර්තමන් සමාජයේ මිනිසුන් නොදන්නා නිසා කරගෙන ඇත්තේ එතුමාට හිරිහැර කිරීමෙන් මහත් පවකි.

ඉවක් බවක් නැතිව එම ප්‍රදේශයට යාම නිසා එතුමාට මිනිසුන්ගේ කාමරාගය නීවරණයක් (නිවන වැසීමක්) වී ඇත. ලිපියේ තිබූ කරුණු අනුවත් බුදු දහම අනුවත් එය මහත් පාපයකි. ලිපියේ හැටියට දෙවි පිහිට ලබන්න කැබිලිත්තට ගොස් එතුමන්ට හිරිහැර කිරීම නොව නිවසේ ඉඳගෙන පංචශීලයේ පිහිටා ප්‍රතිපත්ති ගරුක වූවානම් එම අකුසලය නොකෙරෙනු ඇත. මිත්මතු අවිද්‍යා අන්ධකාරය දුරැලීමට උත්සාහවත් වෙමු. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ද අවවාදයයි. එය දෙවිපිහිට ලැබීමටද හේතුවේ. ශ්‍රී ස්කන්ධ දෙවියන්ද ඒ අවවාදයේ පිහිටා අවිජ්ජානුසය දුරුකිරීමේ උත්සාහයේ යෙදී ඇති බව ලිපියට අනුව නොවැටහේද? දෙවියන්ටත් "බුදුසරණ" මය. නරයන් වූ අපි ගැන කවර කථාද?

මධු පිණ්ඩික සූත්‍රයේ සඳහන් ඉහත විස්තර කළ සප්ත විධ අනුසය ධර්මයන් පවතින සිතකට දඬු ගැනීම, ආයුධ ගැනීම, කළහ, විග්‍රහ, විරුද්ධ කථා, කේලාම් කීම, බොරු කීම වැනි අකුසල ධර්මයන්ට පෙළඹෙනුයේ "පරියුට්ඨාන" අවස්ථාව හෙවත් ඇසආදී ඉන්ද්‍රියන්ට ගොදුරු වන අරමුණු නිසා හාත්පසින්ම නැගී සිටීමයි ආවේග යනුද එයයි. ඉහත කී අකුසලයන්ට පෙළඹවීමයි. "විතික්කම" අවස්ථාව යනු ඉහත කී කෙළෙස් පිටාර ගැලීමයි. එය පිටාර ගලනුයේ කයින් සහ වචනයෙනි. මේ අදියර තුන පාලනයට භාග්‍යවතුන් වහන්සේ ශික්ෂණ තුනක් දේශනා කළා. එනම් සීලයෙන් විතික්කම අවස්ථාවත් සමාධියෙන් පරියුට්ඨාන අවස්ථාවත් ප්‍රඥාවෙන් අනුසය අවස්ථාවත් පාලනය කර ගැනීමටයි. මේ අදියර තුනෙන් ඉතා භයානක වන්නේ විතික්කම හෙවත් සමාජයට කෙළෙස් මුදා හැරීමයි. එය වලකාලීම සඳහා කය සහ වචනය සංවර කර ගත යුතුය. එසේ කය වචන සංවර කරගැනීම හික්මීමයි. හිතේ ස්වභාවය නිතරම අරමුණු පස්සේ දිවීමයි. ඒ දුවන ගතිය නතර කිරීමට කුසල සිතිවිලි වල සිත එකග කරගත යුතුය. ඒ සමාධියයි. එවිට ප්‍රසන්න සිතකි. ලොවටම ශාන්තියකි. අද ලෝකයට අවශ්‍ය වී ඇත්තේ ද එයයි. ඒ සඳහා එකම විසඳුමද මේ සූත්‍රයේ අන්තර්ගතවී ඇත.

අපි නිතර අසා ඇත්තේ ජීවිතය මී පැණියෙන් පිරුණු මී වදයක් ලෙසටයි. ("මී වදයකි ජීවිතේ මී පැණි පිරිලා ඇතේ") එනමුත් මධුපිණ්ඩික සූත්‍රය අසා සිටි ආනන්ද හාමුදුරුවන්ට මී වදයක් ලෙසට මී පැණි පිරී ඇති බවට දැනුනේ ලොව්තුරා සද්ධර්මය තුළයි.

"සබ්බං රසං ධම්ම රසො ජිනාති" සියළු රසයන් ධර්ම රසය විසින් පරදවයි. ඒ සද්ධර්මාවබෝධය ඔබටත් ලැබේවා යි අද පුර පෝදින අදිටන් කර ගනිමු.

**තෙරුවන් සරණයි... !**